0002

00027

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩ සටහන - හයවන මට්ටම

අවසාන පරීක්ෂණය - 2013

**ESU4106-** අධ්‍යාපන කළමනාකරණය

කාලය - පැය තුනයි.

---

දිනය - 2013.03.06 වේලාව - ප.ව.01.30 - ප.ව. 04.30

---

I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. වර්තමානයේ අධ්‍යාපන කළමනාකරණයේ අවශ්‍යතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. "අධ්‍යාපන කළමනාකරණය" හා " අධ්‍යාපන පරිපාලනය" අතර වෙනස දක්වන්න.

03. කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන මූලිකාංග හතර (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ශ්‍රී ලංකාවේ වත්මන් අධ්‍යාපන කළමනාකරණ මට්ටම් රූප සටහනකින් දක්වන්න.

05. ඵලදායී පාසලක් හඳුනාගත හැකි නිර්නායක පහක් (05) සඳහන් කරන්න.

06. "විමධ්‍යගතකරණය" යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? පැහැදිලි කරන්න.

07. සම්පත් කළමනාකරණය සහ පාසල් කාර්ය සාධනය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ අදහස් දක්වන්න.

08. පාසලක් තුළ භාවිතා කරන්නා වූ ප්‍රධාන ගිණුම් නම් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II වන කොටස

09. (i) "කළමනාකරණය" යන පදය නිර්වචනය කරන්න.
(ලකුණු 05)

(ii) බ්ලේක් සහ මවුටන් විසින් ඉදිරිපත් කරන ලද කළමනාකරණ දැලිස විස්තර කරන්න.
(ලකුණු 07)

(iii) අධ්‍යාපන කළමනාකරුවකුට එම දැලිස පිළිබඳ දැනුම වැදගත් වන්නේ ඇයිදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 08)

10. (i) "පාසල් පාදක කළමනාකරණය" යනුවෙන් කුමක් අදහස් වේද ? (ලකුණු 05)

(ii) පාසල් පාදක කළමනාකරණ ක්‍රියාවලිය පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
(ලකුණු 07)

(iii) පාසල් පාදක කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී පාසල් බලධාරීන් මුහුණපාන ගැටලු දෙකක් (02) සඳහන් කර, එම ගැටලු මගහරවා ගැනිමට යෝජනා ඉදිරිපත් කරන්න.
(ලකුණු 08)

11. (i) "නායකයා" "කළමනාකරුවා"ගෙන් වෙන් කොට දක්වන්න.
(ලකුණු 06)

(ii) ඔබ විසින් අධ්‍යයන කරන ලද ඕනෑම නායකත්ව න්‍යායක අඩංගු ප්‍රධාන කරුණු සඳහන් කරන්න.
(ලකුණු 06)

(iii) පාසලේ නායකයා ලෙස විදුහල්පතිවරයෙකුට දැරීමට සිදුවන විවිධ භූමිකා විභාග කරන්න.
(ලකුණු 08)

12. (i) "පන්තිකාමර අධීක්ෂණ ක්‍රියාවලිය" පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(ii) වර්තමාන පාසල් පද්ධතිය තුළ පන්තිකාමර අධීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව සහ වැදගත්කම සාකච්ඡා කරන්න.
(ලකුණු 06)

(iii) පන්ති කාමර අධීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ඉස්මතු වන ගැටලු දෙකක් (02) විග්‍රහ කර, ඒම ගැටලු මඟහරවා ගැනිමට යෝජනා ඉදිරිපත් කරන්න.
(ලකුණු 08)



PG 2966

13. (i) ඔබේ පාසලේ සංවිධාන ව්‍යුහය රූ සටහනකින් දක්වන්න.

(ලකුණු 06)

(ii) ඔබේ පාසලේ සංවිධාන ව්‍යුහය, කළමනාකරණය පිළිබඳ මැක්ස් වෙබර් ගේ අදහස් ආශ්‍රයෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 07)

(iii) ඔබේ පාසලේ සංවිධාන ව්‍යුහය සහභාගිත්ව කළමනාකරණය සුසාධ්‍ය කරනවාද යන්න පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 07)

14. පහත සඳහන් ඕනෑම හතරක් (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ පාසල් පරිපාලන ව්‍යුහය

(ii) පාසල් නායකත්වය

(iii) 1992 දී පාසල් සංවර්ධන මණ්ඩල පිහිටුවීම

(iv) සම්පත් කළමනාකරණයේ දී ඇතිවන ගැටලු

(v) කළමනාකරණයෙහි කාර්යක්ෂමතාව හා ඵලදායිතාව

(ලකුණු 05 x 4 = 20)

හිමිකම් ඇවිරිණි.